2020.06.09

දයාබර ශිෂ්‍ය ශිෂ්‍යයාවන් වෙත,

**මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අවසන් වසර සිසුන්ගේ විභාග කටයුතු ආරම්භ කිරීම සම්බන්ධව**

සෞඛ්‍ය අමාත්‍යාංශයේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පූර්ණ අනුමැතිය සහිතව විශ්වවිද්‍යාල පරිපාලනය විසින් ඔබගේ විභාග කටයුතු ආරම්භ කිරීමට තීරණය කර ඇත. මෙම වැඩපිළිවෙල මාතර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගේ සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ දැඩි අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරනු ලැබේ.

**ඒ අනුව පහත දක්වා ඇති උපදෙස් වලට අනුව ක්‍රියාකරන ලෙස ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

01. නියමිත දිනට ඔබට වෙන් කර ඇති නේවාසිකාගාරයට වාතර්ා කළ යුතු වේ. ඔබගේ නිවසේ සිට ඔබ පැමිණෙන්නේ නම් මෙය අදාල නොවේ.

02. ඔබට තනිව භාවිත කළ හැකි නේවාසිකාගාර කාමරයක් ලැබෙන අතර එම කාමරය සෞඛ්‍ය උපදෙස් වලට අනුව පවත්වා ගැනීම සිදුකළ යුතුය. ඔබගේ කාමරය පිරිසිදුව පවත්වාගන්නේ ද යන්න නිතර පරීක්ෂාවට ලක් කරනු ලැබේ. වැසිකිළි, නාන කාමර සහ කසල බැහැර කිරීමේදී නියමිත උපදෙස් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ.

03. සෞඛ්‍ය අංශ වලින් ලබා දී ඇති උපදෙස් පරිදි නියමිත සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම ඔබගේ වගකීමකි. ඔබ අන් අය සමග කටයුතු කරන සෑම අවස්ථාවකදීම අවම වශයෙන් මීටරයක පරතරයක් පවත්වා ගත යුතු වේ.

04. ඔබගේ පෞද්ගලික කාමරයෙන් පිටතට යන සෑම අවස්ථාවකදීම නිසි ප්‍රමිතියෙන් යුතු මුහුණු ආවරණයක් පැළඳිය යුතුය. නිවසේදී සාදා ගන්නා ලද වාර ගණනාවක් පාවිච්චියට ගත හැකි මුහුණු ආවරණ මේ සඳහා සුදුසු වේ. එක වරක් භාවිතා කර ඉවත දැමිය හැකි වෙළඳපලේ තිබෙන ශල්‍යාගාර මුහුණු ආවරණ ද මේ සඳහා භාවිත කළ හැක. (අවශ්‍ය නම් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ තිබෙන සණස ආයතනයෙන් මුහුණු ආවරණ සහන මිලකට ලබා ගත හැක). ඔබ විසින් මුහුණු ආවරණ නැවත නැවත භාවිත කරන්නේ නම් ඒවා නැවත භාවිතයට ගත හැකි පරිදි සෝදා පවිත්‍ර කරගත යුතුය. ඔබ භාවිතා කළ මුහුණු ආවරණ ඉවත දමන්නේ නම් නියමිත සෞඛ්‍ය උපදෙස් පරිදි ඉවත දැමීම කළ යුතුය.

05. නේවාසිකාගාර ආපන ශාලාවෙන් සහ පීඨ ආපන ශාලාවෙන් හැර වෙනත් කිසිම ස්ථානයකින් ඔබට පිසින ලද ආහාර, වියලි ආහාර හෝ වෙනත් ද්‍රව්‍ය මිලදී ගැනීමට අවසර නොලැබේ.

06. ඔබට අවශ්‍ය අනෙකුත් සියලුම අත්‍යවශ්‍ය ද්‍රව්‍යයන් ඔබ පැමිණෙන විට රැගෙන ආ යුතුය. උදා: දත් බුරුසු, දන්තාලේප, තුවා, ඇඳ ඇතිරිලි ආදිය ඔබට පිටතින් එම ද්‍රව්‍ය ලබාගැනීමට කිසිසේත්ම අවසර නොලැබේ.

07. ඔබගේ දැත් පිරිසිදු කර ගැනීමට අවශ්‍ය සනීපාරක්ෂක දියර ඔබ සතුව තිබිය යුතු අතර ඒවා ඔබ විසින් සපයා ගත යුතුය. සනීපාරක්ෂක දියර විශ්වවිද්‍යාලය මගින් නොමිලේ සපයනු නොලැබේ. (අවශ්‍ය නම් විශ්වවිද්‍යාල පරිශ්‍රයේ තිබෙන සණස ආයතනයෙන් සහන මිලකට සනීපාරක්ෂක දියර ලබා ගත හැක.)

08. අදාළ දිනවලදී නේවාසිකාගාර පරිශ්‍රයට, විශ්වවිද්‍යාල පරිශ්‍රයට, පීඨ පරිශ්‍රයට, ආපන ශාලාවට සහ විභාග ශාලාවට ඇතුල්වීමේදී සබන් යොදා දැත් හොඳින් පිරිසිදු කරගෙන ඇතුල් විය යුතුය. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සලසා දී ඇත. පෞද්ගලික ස්ථාන වලදී ද ඔබගේ දැත් නිතර පිරිසිදුව තබාගැනීමටත් අවශ්‍යතාව පරිදි නිතර සබන් යොදා දැත් පිරිසිදු කිරීමටත් වග බලාගන්න.

09. දෛනිකව ඔබගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම සහ ඔබගේ අවශ්‍යතාවන් සොයා බැලීම, ඒ සඳහා අනුයුක්ත කර ඇති මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා විසින් සිදුකරනු ලැබේ. ඒ සඳහා  අවශ්‍ය සහයෝගය ලබා දීම ඔබගේ වගකීමකි.

10. ඔබගේ විභාග කටයුතු මෙම ලිපිය සමග අමුණා ඇති කාලසටහනට අනුව පවත්වනු ලැබේ.

11. ඔබගේ සහ අනෙකුත් සියලු දෙනාගේ ආරක්ෂාව තහවුරු කිරීමට ඔබ විසින් ඉතා වගකීමෙන් ක්‍රියා කළ යුතු බව අවධාරණය කර සිටින අතර, සෞඛ්‍ය බලධාරීන් සහ විශ්විද්‍යාලය මගින් ඔබට දී ඇති උපදෙස් අනුව ක්‍රියාකිරීමට අසමත් වුවහොත් ඔබට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීමට සිදුවන බව දන්වා  සිටිමි. එමෙන්ම කොවිඩ්19 ට අදාළව රජය විසින් පනවා ඇති නීති රීති සහ රෙගුලාසි ඔබ උල්ලංඝනය කරන්නේ නම් ඔබට නිරෝධායානයට ලක්වීමට හෝ නීතිමය ගැටලු වලට මුහුණ දීමට  සිදුවිය හැකි බවද දන්වා සිටිමි.

ශ්‍රී ලංකා රජයේ මගපෙන්වීම අනුව රුහුණ විශ්වවිද්‍යාලය ඔබගේ අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කර උපාධිය ලබාගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දෙනු ඇත. වැඩිහිටි ශිෂ්‍යයකු ලෙස  ඔබගේ නිවැරදි හැසිරීම තුළින් ඔබගේත් අන් අයගේත් සෞඛ්‍යය ආරක්ෂා කිරීමට  වගකීමෙන් ක්‍රියාකරන ලෙස ඉල්ලා සිටිමි.

පීඨාධිපති
මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය
රුහුණ විශ්වවිද්‍යාලය

**09th June 2020**

Dear Students,

**Commencement of Examinations for the Final Year Students in the Faculty of Humanities & Social Sciences**

University administration has decided to commence your examinations with concurrence of the Ministry of Health and University Grants Commission. This will be conducted under the strict supervision of the Medical officer of Health of Matara and the Public Health Inspectors. Thus, you are kindly instructed to follow rules, regulations and guidelines given below.

1. Arrive at the assigned hostel on the allocated date and time **.** (Kindly note that you are not permitted to use private boarding houses. This does not apply for those commuting from home).
2. You are given a single room for accommodation in the hostel. It is your responsibility to keep it clean and the rooms will be inspected for cleanliness daily. Please follow the instructions given for using the common toilets, bathrooms and in disposing garbage.
3. It is your responsibility to maintain social distancing in accordance with the instructions given by the Department of Health Services by at least one meter.
4. Wear an appropriate face mask properly on leaving the room. Homemade reusable face masks are suitable for this purpose. You will need several face masks a day for this purpose. Disposable commercially available surgical masks could be an alternative. These would be available at SANASA cooperative shop inside the University. Face masks could be discarded as per the prescribed instructions to the given bin as infectious biological waste.
5. Food supply would be available from the University canteens available at the Faculty and the hostels. You will not be permitted to go out for meals after arrival.
6. Personal requirements eg: Tooth paste, tooth brushes, bed sheets, towels must be brought on arrival. You will not be allowed to buy them outside.
7. Keep hand sanitizers with you all the time to clean your hands. Sanitizers for personal use would not be given free by the University. However, the university will make sanitizers available at a concessionary rate in the SANASA cooperative shop.

8. You must enter university, faculty premises or examination hall or any other facility after washing your hands thoroughly. Hand washing facilities will be provided at several locations in the premises. Make sure that you wash your hands thoroughly at private places as well.
9. Public Health Officer (PHI) who is in charge of the monitoring of your health will check your health status daily. Please extend your cooperation to the PHI.
10. The schedule for all your examinations will be continued as outlined herewith
11. Failure to abide by the instructions given by the university and the health authorities will lead to disciplinary action. Violation of quarantine rules and regulations of the government in relation to Covid 19, will lead to legal action or quarantine procedure.

UOR under the guidance of the GOSL is supporting completion of your education and graduate as early as possible. Take responsibility as an adult student and successfully complete your examinations, behave responsibly to protect your health and that of others.

Dean

Faculty of Humanities & Social Sciences

University of Ruhuna